**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

අදියර II විභාගය - 2023 ජූලි

## (203) ව්‍යාපාර නීතිය

(Business Law)

## A - කොටස

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය ලකුණු 25 ක් සඳහා වූ වෙන් කළ වාස්තවික ප්‍රශ්න 14 කින් සමන්විත විය.

අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මෙම ප්‍රශ්නයට උත්තර සපයා ඇත. බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්නයට වෙන් කළ මුළු ලකුණුවලින් අඩකට වඩා වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබුණි. ඇතැම් අයදුම්කරුවන් ප්‍රශ්නය සඳහා වෙන් කළ සමස්ත ලකුණු ප්‍රමාණයම ලබාගෙන තිබුණි.

අයදුම්කරුවන්ගෙන් සැලකිය යුතු පිරිසක් ප්‍රශ්න අංක **1.10** සහ **1.13** සඳහා නිවැරදි උත්තරය ලිවීමට අපොහොසත් වූ බව පෙනී ගියේය. යථාකාල ධාරකයා සහ භාණ්ඩ විකිණීමේ ගිවිසුමක මිල තීරණය කරනු ලබන ආකාර පිළිබඳව දැනුමේ ඌනතා පැවතීම මෙම තත්වයට හේතු වූ බව නිරීක්ෂණය විය.

සමස්තයක් වශයෙන් මෙම ප්‍රශ්නය සඳහා වූ කාර්යය සාධනය සතුටුදායක වූ අතර එය අපේක්ෂකයන් බහුතරයකට තම සමත් ලකුණ කරා ළඟා වීමට උපකාරී විය.

**A** කොටස සඳහා ලකුණු ලබා ගැනීම පිණිස අයදුම්කරුවන්ට සිවිල් නීතිය, අපරාධ නීතිය, භාණ්ඩ විකිණීමේ ආඥා පනත, වාණිජ නීතිය, අන්තර්ජාතික නීතිය, මුදල් විශුද්ධිකරණය පිළිබඳ නීතිය, ගණුදෙණු කළ හැකි ලියවිලි පිළිබඳ නීතිය යන ක්ෂේත්‍ර පිළිබඳව හොඳ දැනුමක් තිබිය යුතුය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## B කොටස

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නයෙන් රක්ෂණ නීතිය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කරන ලදී. මෙය තරමක සරල ප්‍රශ්නයක් වන අතර උපරිම විශ්වාසයේ මූලධර්මය මත පදනම් විය. සියලුම අයදුම්කරුවන් පාහේ මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා තිබුණි.

බහුතරයක් අයදුම්කරුවන් උපරිම විශ්වාසයේ මූලධර්මය නිවැරදිව පැහැදිලි කොට තිබුණි. ගිවිසුමට එළඹෙන අවස්ථාවේදී **වලිමුණි** විසින් උපරිම විශ්වාසය බිඳ හෙලා ඇති බැවින් ඔහුගේ බිරිඳට **XYZ රක්ෂණ සමාගමෙන්** වන්දි සඳහා හිමිකම් පෑමට අයිතියක් නැත. බහුතර අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය නිවැරදිව හඳුනාගෙන පිළිතුරු සපයා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නය මගින් කාර්මික නීතිය පිළිබඳ දැනුම ප්‍රශ්න කරන ලදී. මෙය තරමක සරල ප්‍රශ්නයක් වන අතර බහුතරයක් සිසුන් ප්‍රශ්නයේ මෙම කොටස සඳහා උත්සහ දරා බොහෝ දුරට නිවැරදි පිළිතුරු සපයා තිබුණි.

**රෝසි** විසින් හිමිකම් කියනු ලබන පාරිතෝෂිකය ගණනය කිරීම ප්‍රශ්නය මඟින් අපේක්ෂා කරන ලදී. මෙම ගණනය කිරීමේදී අඩ මසක වැටුප සලකා බැලිය යුතු බව බොහෝ අපේක්ෂකයන් හඳුනාගෙන නොමැත. එසේම රෝසිට තමාගේ අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභ නැවත ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳ ප්‍රශ්න කොට තිබුණි.මෙම කොටසට සිසුන් බහුතරය නිවැරදිව පිළිතුරු සපයා තිබුණි. සේවක භාරකාර අරමුදලේ කාර්යයන් පිළිබඳ බහුතරයක් සිසුන් දුර්වල පිළිතුරු සපයා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නය මඟින් බුද්ධිමය දේපළ නීතිය පිළිබඳව ප්‍රශ්න කොට තිබුණි. මෙය බුද්ධිමය දේපළ නීතිය හා සම්බන්ධ තරමක් සරල ප්‍රශ්නයකි.  සියලුම අයදුම්කරුවන් පාහේ ප්‍රශ්නයට උත්සහ දරා නිවැරදි පිළිතුරු සපයා තිබුණි.

සුරේශ්ගේ ග්‍රන්ථය අවභාවිතා කිරීම සම්බන්ධව නිමල්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සුරේශ්ගේ බිරිඳට බුද්ධිමය දේපළ පනත යටතේ අයිතිවාසිකම් පවතින බව බොහෝ අයදුම්කරුවන් නිවැරදිව හඳුනාගෙන තිබුණි. යම් පොතක කතුවරයාගේ මරණයෙන් පසු එම ග්‍රන්ථය පිළිබඳව බුද්ධිමය දේපළ අයිතිවාසිකම් පවතින්නේ කතුවරයාගේ උරුමකරුවන් වෙතය. සිසුන් සාධාරණ පිළිතුරු ලබා දෙමින් ලකුණු උපයාගෙන තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නය මඟින් හවුල් ව්‍යාපාර නීතිය පිළිබඳව ප්‍රශ්න කොට තිබුණි. හවුල් ව්‍යාපාර නීතිය හා සම්බන්ධ තරමක් සරල ප්‍රශ්නයකි. හවුල් ව්‍යාපාරයක මූලිකාංග පිළිබඳව ප්‍රශ්න කොට තිබුණි. සියලුම අයදුම්කරුවන් පාහේ ප්‍රශ්නයට උත්සහ දරා මධ්‍යස්ථ පිළිතුරු සපයා තිබුණි.

එසේ මෙම ප්‍රශ්නය මඟින් හවුල්කරුවෙකු සතු ව්‍යංග බලතල ප්‍රශ්න කොට තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නය මඟින් නියෝජ්‍යත්ව නීතිය පිළිබඳ දැනුම පරික්ෂා කොට තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට උත්සහ දරා තරමක් දුරට සාර්ථක පිළිතුරු සපයා තිබුණි. ඇතැම් අයදුම්කරුවන් සරත් හා කපිල අතර පවතින නියෝජ්‍යත්ව සබඳතාවයේ ස්වරූපය නිවැරදිව හඳුනා ගැනීමට අපොහොසත් වී ඇත.

මෙම ප්‍රශ්නය මඟින් තව දුරටත් කපිල විසින් මොහොමඩ්ගෙන් ණය පදනමට මිලදී ගත් සත්ව ආහාර සඳහා ගෙවීම් කිරීමට සරත්ට ඇති වගකීම පිළිබඳව ප්‍රශ්න කොට තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් සත්ව ආහාර මිලදී ගැනීමට සරත්ට ඇති ව්‍යංග බලය නිවැරදිව හඳුනාගෙන නොතිබුණි.

**C කොටස** සඳහා සිසුන් ඇතැමෙකු නිවැරදි පිළිතුරු සපයා නොතබුණි. එසේම ඔවුන් නියෝජිතයා තම බලය අභිබවා කටයුතු නොකළ යුතුය යන්න හඳුනාගෙන නොතිබුණි. ඉතා සීමිත සිසුන් පිරිසක් පමණක් නිවැරදි පිළිතුරු ලියා ප්‍රශ්නය සඳහා හිමි ලකුණු ලබාගෙන තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

## C කොටස

**ප්‍රශ්න අංක 07**

**(A) කොටස**

මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත වේ. **(A)**, **(B)** හා **(C) කොටස්** ගිවිසුම් නීතිය මත පදනම් වී ඇත. **(A)** හා (A) කොටස් සඳහා පිළිතුරු සැපයීම සාධනීය මට්ටමක පැවතුණි. බහුතරයක් අයදුම්කරුවන් **කහතුඩුව** හා **අජ්සාරි** අතර වලංගු ගිවිසුමක් පවතින බවත් තැපැල් මාර්ගික රීතිය අදාළ වන බවටත් හඳුනාගෙන තිබුණි.

**(C) කොටසද** තැපැල් මාර්ගික රීතිය මත පදනම් වන බවත් **කහතුඩුවට, අජ්සාරිට** එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත හැකි බවත් බොහෝ අයදුම්කරුවන් හඳුනාගෙන තිබුණි.

**(B) කොටස**

මෙම ප්‍රශ්නය භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ ව්‍යංග වගන්ති මත පදනම් වේ. බහුතරයක් පිළිතරු මඟින් මෙම විෂය කරුණ පිළිබද ප්‍රමාණාත්මක දැනුමක් පිළිබිඹු නොවේ. සියලුම අයදුම්කරුවන් පාහේ මෙම කොටසට උත්සහ දරා තිබුණද ඔවුන්ගේ කාර්යය සාධනය අපේක්ෂිත මට්ටමේ නොවීය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

\- - -

**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමුකළ යුතු පොදු කරුණු:**

(1) නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව විභාගයට පෙර මැනවින් අධ්‍යයනය කිරීම සහ ප්‍රශ්න තුල භාවිත කර ඇති කළයුතු ක්‍රියාව තුලින් බලාපොරොත්තුවන උත්තර ක්‍රියා නිර්වචනයට අනුකූලවන ලෙස මැනවින් ඉදිරිපත් කිරීම.

(4) ස්ව-අධ්‍යන පාඩම්මාලාව සහ මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා ආදිය මැනවින් පරිශීලනය කිරීම.

(5) උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ව්‍යාපාර නීතිය හා අචාරධර්ම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුළින් එකිනෙක නීතිමය සංකල්ප ප්‍රායෝගික භාවිතයන්ට යොදවමින් ඒවා අතර ඇති වෙනස සංසන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර භාරදීමට පෙර ප්‍රශ්න අංක /විභාග අංකය ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂාකර බැලීම.

(12) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -